# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ජාතික ඉඩම් කොමිෂන් සභාව

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන උපලේඛනයේ, I වන ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුව), II වන පරිශිෂ්ටයේ 3 වන ඡේදයේ විධිවිධාන බලාත්මක කිරීම සඳහා ජාතික ඉඩම් කොමිෂන් සභාව පිහිටුවීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

---

සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා විසින් 2024 සැප්තැම්බර් මස 03 වන දින
ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2024 අගෝස්තු මස 16 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[294 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 36.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ජාතික ඉඩම් කොමිෂන් සභාව

එල්.ඩී.-ඕ 24/2024

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන උපලේඛනයේ, I වන ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුව), II වන පරිශිෂ්ටයේ 3 වන ඡේදයේ විධිවිධාන බලාත්මක කිරීම සඳහා ජාතික ඉඩම් කොමිෂන් සභාව පිහිටුවීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ පනත 2024 අංක     දරන ජාතික ඉඩම් කොමිෂන් සභාව පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

## I වන කොටස

## ජාතික ඉඩම් කොමිෂන් සභාව පිහිටුවීම

ජාතික ඉඩම් කොමිෂන් සභාව පිහිටුවීම

**2.** (1) ජාතික ඉඩම් කොමිෂන් සභාව යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන (මෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව, (1) වන උපවගන්තිය මගින් එයට පවරන ලද නාමය යටතේ සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද, එකී නාමයෙන් කොමිෂන් සභාව විසින් ද එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ සංයුතිය

3. (1) කොමිෂන් සභාව, පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු යः-

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන් -

(i) ඉඩම් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ධුරයට වඩා පහළ නොවන ධුරයක නිලධරයකු විය යුතු, ලේකම්වරයාගේ නියෝජිතයකු;

(ii) ස්වදේශ කටයුතු විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ධුරයට වඩා

පහළ නොවන ධුරයක නිලධරයකු විය යුතු, ලේකම්වරයාගේ නියෝජිතයකු;

(iii) (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ පත් කරන ලද ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා;

(iv) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 13 වන වගන්තිය යටතේ පත් කරන ලද මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා;

(v) (441 වන අධිකාරය වූ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ පත්කරන ලද කෘෂිකර්ම අධ්‍යක්ෂ-ජනරාල්වරයා;

(vi) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 13 වන වගන්තිය යටතේ පත් කරන ලද නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා;

(vii) භාණ්ඩාගාර ලේකම්වරයා විසින් නම් කරනු ලබන අධ්‍යක්ෂ-ජනරාල් ධුරයට වඩා පහළ නොවන ධුරයක නිලධරයකු විය යුතු භාණ්ඩාගාරයේ නියෝජිතයකු;

(viii) (451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 58 වන වගන්තිය යටතේ පත් කරන ලද වන සංරක්ෂක ජනරාල්වරයා; සහ

(ix) (469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ කාර්යය සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා වශයෙන් පත් කරනු ලැබ ඇති වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ-ජනරාල්වරයා;

(ආ) ඉඩම්, කෘෂිකර්මය, පාංශු විද්‍යාව, බිම් පරිභෝජන සැලසුම්, නාගරික සංවර්ධනය, දිය බෙත්ම කළමනාකරණය හෝ වැවිලි කෘෂිකර්මය යන ක්ෂේත්‍රයක දැනුම සහ ප්‍රවීණත්වය ඇති තැනැත්තන් අතුරින් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් හතරදෙනකු; සහ

(ඇ) (මෙහි මින් මතු "නම් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) පළාත් සභා නියෝජනය කිරීම සඳහා එක් එක් පළාත් සභාව විසින් නම් කරනු ලබන ඉඩම් විෂයය පිළිබඳ පළපුරුද්ද සහ දැනුම සහිත සාමාජිකයන් නවදෙනකු.

(2) ජනාධිපතිවරයා විසින්, 8 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ සඳහන් සාමාජිකයන් පත් කරනු ලැබිය යුතු ය.

(3) ජනාධිපතිවරයා විසින්, පත් කළ සාමාජිකයන් අතුරින් කොමිෂන් සභාවේ සභාපතිවරයා පත් කළ යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයකුවීම සඳහා නුසුදුසුකම්

4. තැනැත්තකු -

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම අවසන් වුවහොත්;

(ආ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ එවැන්නකු බවට පත්වන්නේ නම්;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් නීතියක් යටතේ බුන්වත් හෝ වස්තු භංගත්වයට පත් වූ තැනැත්තකු බවට ප්‍රකාශ කරන ලදුව නිදහස් නොකරන ලද බුන්වත් හෝ වස්තු භංගත්වයට පත් වූවකු වේ නම්;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල තැනැත්තකු බවට තීරණය කරනු ලැබ හෝ ප්‍රකාශ කරනු ලැබ ඇත්නම්;

(ඉ) මාස හයකට වඩා අඩු නොවන කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමෙන් දඬුවමක් ලැබිය යුතු චරිත දූෂණාත්මක වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබ ඇත්නම්;

(ඊ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් හෝ විඳ ඇත්නම්; හෝ

(උ) කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් ඒ තැනැත්තා විසින් ස්වකීය කර්තව්‍ය කිරීමේ දී අගතිදායක ලෙස බලපෑමට ඉඩ ඇති යම් මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවක් දරන්නේ නම්,

ඒ තැනැත්තා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට, නම් කරනු ලැබීමට හෝ තවදුරටත් කටයුතු කරගෙන යාමට නුසුදුසු විය යුතු ය.

කොමිෂන් සභාවේ පත් කළ සාමාජිකයන්ගේ සහ නම් කළ සාමාජිකයන්ගේ ධුර කාලය

**5.** කොමිෂන් සභාවේ සෑම පත් කළ සාමාජිකයකු ම සහ නම් කළ සාමාජිකයකු ම මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් ධුරය කලින් හිස් කරන ලද හොත් මිස, අවස්ථාවෝචිත පරිදි, ඔහුගේ පත්වීමේ හෝ නම් කිරීමේ දිනයේ සිට අවුරුදු පහක කාලයක් ධුරය දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, අනුගාමී හෝ අනන්‍යාකාරයක තවත් එක් ධුර කාලයකට නොවැඩි ධුර කාලයක් සඳහා නැවත පත් කරනු ලැබීම හෝ නම් කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු ය.

පත් කළ සාමාජිකයන් ඉවත් කිරීම, ඉල්ලා අස්වීම ආදිය

**6.** (1) කොමිෂන් සභාවේ යම් පත් කළ සාමාජිකයකු විසින්, ජනාධිපතිවරයා අමතා තත්කාර්ය සඳහා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එකී ඉල්ලා අස්වීම, ජනාධිපතිවරයා විසින් ලිඛිතව පිළිගනු ලැබූ දිනයේ සිට බලාත්මක විය යුතු ය.

(2) ජනාධිපතිවරයා විසින්, ඒ සඳහා වූ හේතු දක්වා, යම් පත් කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. ධුරයෙන් ඉවත් කරනු ලැබූ පත් කළ සාමාජිකයකු කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස නැවත පත් කරනු ලැබීමට හෝ කොමිෂන් සභාවේ වෙනත් යම් තත්ත්වයක සේවය කිරීමට සුදුස්සකු නොවිය යුතු ය.

(3) මරණය, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම හේතුවෙන් යම් පත් කළ සාමාජිකයකුගේ ධුරය හිස් වන අවස්ථාවක, ජනාධිපතිවරයා විසින් 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ සහ (2) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය. එම තැනැත්තා විසින් ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති ධුර කාලය සඳහා ධුරය දරනු ලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාවේ යම් පත් කළ සාමාජිකයකුට රෝගාතුර වීම හෝ වෙනත් යම් හේතුවක් මත හෝ මාස තුනකට නොඅඩු කාලසීමාවක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන්, ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක, ජනාධිපතිවරයා විසින් 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ සහ (2) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඒ සාමාජිකයා නොමැති කාලසීමාව තුළ දී ඔහු වෙනුවට කටයුතු කිරීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(5) කොමිෂන් සභාවේ යම් පත් කළ සාමාජිකයකු, සිය නොපැමිණීම පිළිබඳ ව සභාපතිවරයා වෙත පූර්ව දැනුම් දීමකින් තොරව කොමිෂන් සභාවේ අනුගාමී රැස්වීම් තුනකට සහභාගී වීමට අපොහොසත් වන අවස්ථාවක, එම සාමාජිකයා එම තෙවන රැස්වීමේ දිනයේ සිට සිය ධුරය අතහැර ගියා සේ සලකනු ලැබිය යුතු අතර, එවිට, ජනාධිපතිවරයා විසින්, 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ සහ (2) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

නම් කළ සාමාජිකයන් ඉවත් කිරීම, ඉල්ලා අස්වීම ආදිය

**7.** (1) කොමිෂන් සභාවේ යම් නම් කළ සාමාජිකයකු, එම සාමාජිකයා නම් කළ පළාත් සභාව විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(2) කොමිෂන් සභාවේ යම් නම් කළ සාමාජිකයකු විසින්, එම සාමාජිකයා නම් කළ පළාත් සභාවේ සභාපතිවරයා සහ කොමිෂන් සභාවේ සභාපතිවරයා අමතා තත්කාර්ය සඳහා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එකී ඉල්ලා අස්වීම, එම පළාත් සභාවේ සභාපතිවරයා විසින් ලිඛිතව පිළිගනු ලැබූ දිනයේ සිට බලාත්මක විය යුතු ය.

(3) මරණය, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම හේතුවෙන් යම් නම් කළ සාමාජිකයකුගේ ධුරය හිස්වන අවස්ථාවක, අදාළ පළාත් සභාව විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ඉඩම් විෂයය පිළිබඳ පළපුරුද්ද සහ දැනුම සහිත වෙනත් තැනැත්තකු නම් කරනු ලැබිය යුතු ය. එම තැනැත්තා විසින් ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති ධුර කාලය සඳහා ධුරය දරනු ලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාවේ යම් නම් කළ සාමාජිකයකු රෝගාතුර වීම හෝ වෙනත් හේතුවක් මත හෝ මාස තුනකට නොඅඩු කාලසීමාවක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන් ස්වකීය ධුරයෙහි කාර්ය ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක, අදාළ පළාත් සභාව විසින් එම සාමාජිකයා නොමැති කාලසීමාව තුළ දී ඔහු වෙනුවට කටයුතු කිරීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(5) කොමිෂන් සභාවේ යම් නම් කළ සාමාජිකයකු, සිය නොපැමිණීම පිළිබඳ ව කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත පූර්ව දැනුම් දීමකින් තොරව කොමිෂන් සභාවේ අනුගාමී රැස්වීම් තුනකට සහභාගී වීමට අපොහොසත් වන අවස්ථාවක, ඒ සාමාජිකයා එම තෙවන රැස්වීමේ දිනයේ සිට සිය ධුරය අතහැර ගියා සේ සලකනු ලැබිය යුතු අතර, අදාළ පළාත් සභාව විසින් ඉඩම් විෂයය පිළිබඳ පළපුරුද්ද සහ දැනුම සහිත වෙනත් තැනැත්තකු එම පුරප්පාඩුව පිරවීම සඳහා නම් කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ පත් කළ සාමාජිකයන්ගේ යම් සම්බන්ධතා හෙළි කිරීම

8. (1) කොමිෂන් සභාවේ සෑම පත් කළ සාමාජිකයකු විසින්, එලෙස සාමාජිකයකු වශයෙන් ධුරය භාරගැනීමට පෙරාතුව එකී පත්වීමේ අවස්ථාව වන විට ස්වකීය මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතා පිළිබඳව පොදු හෙළිදරව් කිරීමක් නියමිත ආකෘති පත්‍රයකින් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඔහුගේ ධුර කාලය ඇතුළත දී වාර්ෂිකව එම හෙළිදරව් කිරීම ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් සිදු කරන ලද හෝ සිදු කිරීමට යෝජිත යම් කොන්ත්‍රාත්තුවක්, ගිවිසුමක් හෝ කටයුත්තක් හෝ වෙනත් යම් කාරණයක් කෙරෙහි ඍජු හෝ වක්‍ර සම්බන්ධතාවක් ඇති කොමිෂන් සභාවේ සාමාජිකයකු විසින් ස්වකීය සම්බන්ධතාවයේ ස්වභාවය සහ ප්‍රමාණය පිළිබඳව වහාම කොමිෂන් සභාව වෙත හෙළිදරව් කළ යුතු අතර, එවැනි සෑම හෙළිදරව් කිරීමක් ම කොමිෂන් සභාවේ කාර්ය සටහන්වල වාර්තාගත කරනු ලැබිය යුතු ය. ඉන්පසුව, ඒ සාමාජිකයා විසින් එම කොන්ත්‍රාත්තුව, ගිවිසුම, කටයුත්තක හෝ වෙනත් කාරණයක් සම්බන්ධයෙන් වූ කොමිෂන් සභාවේ කවර හෝ සාකච්ඡාවකට හෝ තීරණයකට සහභාගී නොවිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින්, එක් එක් කාරණය මත පදනම්ව, (1) වන සහ (2) වන උපවගන්තිවල සඳහන් සම්බන්ධතා ගැටුම් පිළිබඳ ලේඛනයක් හෝ වාර්තාවක් පවත්වා ගෙන යා යුතු ය.

කොමිෂන් සභාවේ ගණපූරණය සහ රැස්වීම්

**9.** (1) කොමිෂන් සභාවේ රැස්වීම්, යටත් පිරිසෙයින් සෑම මසක ම එක් වරක්වත් පවත්වනු ලැබිය යුතු ය. නැතහොත් මේ පනත මගින් නිශ්චිතව දක්වා ඇති කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, ඉටු කිරීමේ සහ කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන පරිදි පවත්වනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය, සභාපතිවරයා ද ඇතුළුව සාමාජිකයන් එකොළොස්දෙනකු විය යුතු ය.

(3) කොමිෂන් සභාවේ රැස්වීමක් -

(අ) රැස්වීම සඳහා නියම කරගත් ස්ථානයේ දී, දිනයේ දී සහ වේලාවේ දී රැස්ව සිටින, ගණපූරණය සංස්ථාපනය කරන සාමාජිකයන් සංඛ්‍යාව විසින්; හෝ

(ආ) රැස්වීමට සහභාගී වන ගණපූරණය සංස්ථාපනය කරන සියලු සාමාජිකයන්ට, රැස්වීම පවත්වනු ලබන කාලසීමාව තුළ රැස්වීමට සහභාගී වන එක් එක් සාමාජිකයා සමගාමීව දැකීමට සහ ඇසීමට හැකි ශ්‍රව්‍ය-දෘශ්‍ය සන්නිවේදන ක්‍රම මගින්,

පවත්වනු ලැබිය හැකි ය.

(4) කොමිෂන් සභාවේ යම් රැස්වීමක දී තීරණය කිරීම සඳහා වන සියලු ප්‍රශ්න, ඒ රැස්වීමට පැමිණ සිටින සහ ඡන්දය ප්‍රකාශ කරන බහුතර සාමාජිකයන්ගේ ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සංඛ්‍යාව සමාන වන අවස්ථාවක, සභාපතිවරයාට ස්වකීය ඡන්දයට අමතරව, තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(5) සභාපතිවරයා පැමිණ සිටී නම්, ඔහු කොමිෂන් සභාවේ සෑම රැස්වීමක ම මුලසුන දරනු ලැබිය යුතු ය. කොමිෂන් සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කරගනු ලබන යම් සාමාජිකයකු කොමිෂන් සභාවේ ඒ රැස්වීමේ මුලසුන දරනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ මීට ඉහතින් වූ විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාවේ රැස්වීම් කැඳවීම හා පැවැත්වීම සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාමේ දී අනුගමනය කරනු ලැබිය යුතු කාර්යපටිපාටිය කොමිෂන් සභාව විසින් විධිමත් කරනු ලැබිය හැකි ය.

යම් පුරප්පාඩුවක් පැවතීමේ හේතුවෙන් කොමිෂන් සභාවේ ක්‍රියා හෝ කටයුතු බල රහිත නොවන බවට සලකනු ලැබිය යුතු බව

**10.** කොමිෂන් සභාව විසින්, එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීම නොතකා කටයුතු කරනු ලැබිය හැකි අතර, කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීමේ හෝ එහි සාමාජිකයකුගේ පත් වීම සම්බන්ධයෙන් යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් එහි යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් බල රහිත නොවිය යුතු ය. නැතහොත් බල රහිත බවට සලකනු නොලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික

**11.** ජනාධිපතිවරයා විසින් මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට සහ අනුප්‍රමාණය මත වූ පාරිශ්‍රමික කොමිෂන් සභාවේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාව විසින් විශේෂඥයන්ට රැස්වීම්වලට ආරාධනා කළ හැකි බව

**12.** (1) කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ කර්තව්‍ය ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා, කොමිෂන් සභාවේ යම් රැස්වීමක දී, කටයුතු කරනු ලබන යම් විෂයය කාරණයක් පිළිබඳ ප්‍රවීණතාවක් ඇති විශේෂඥයන්ගේ අදහස් ලබාගැනීමේ කාර්යය සඳහා, ඒ විෂයය කාරණය සම්බන්ධයෙන් ප්‍රවීණතාවක් ඇති විශේෂඥයන්ට අවශ්‍ය යයි සලකන කවර හෝ අවස්ථාවක, කොමිෂන් සභාවේ ඒ රැස්වීම සඳහා ආරාධනා කරනු ලැබිය හැකි යː

එසේ වුව ද, ඒ විශේෂඥයන්ගේ අදහස් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ පරම අභිමතය කොමිෂන් සභාව සතු විය යුතු ය.

(2) විශේෂඥයන්ට, ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකම් නොතිබිය යුතු ය.

(3) විශේෂඥයන්ට, කොමිෂන් සභාවේ රැස්වීම්වලට සහභාගී වීම වෙනුවෙන්, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි ගෞරව දීමනාවක් ගෙවනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ මුද්‍රාව

**13.** (1) කොමිෂන් සභාවේ මුද්‍රාව කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන පරිදි විය යුතු ය.

(2) කොමිෂන් සභාවේ මුද්‍රාව-

(අ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය; සහ

(ආ) කොමිෂන් සභාව විසින්, කලින් කල, නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ යම් තැනැත්තකු හෝ තැනැත්තන් භාරයේ තබනු ලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාවේ මුද්‍රාව, කොමිෂන් සභාවේ අනුමතය ඇතිව හැර සහ තමන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු සභාපතිවරයා සහ කොමිෂන් සභාවේ වෙනත් එක් සාමාජිකයකු ඉදිරිපිට දී හැර, කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතබනු ලැබිය යුතු යː

එසේ වුව ද, යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට කොමිෂන් සභාවේ මුද්‍රාව තබන විට සභාපතිවරයාට පැමිණ සිටීමට නොහැකි වන අවස්ථාවක, සභාපතිවරයා විසින් තත්කාර්ය සඳහා ලිඛිතව බලය දෙන ලද කොමිෂන් සභාවේ වෙනත් යම් සාමාජිකයකුට මේ උපවගන්තියේ මීට ඉහතින් වූ විධිවිධානයට අනුකූලව ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබීම සඳහා නිසි බලය තිබිය යුතු ය.

(4) කොමිෂන් සභාවේ මුද්‍රාව තබන ලද සාධන පත්‍රවල සහ ලේඛනවල ලේඛනයක් කොමිෂන් සභාව විසින් පවත්වා ගෙනයනු ලැබිය යුතු ය.

## II වන කොටස

### කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

**14.** (1) කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු යː-

(අ) දේශපාලනික හෝ ජනවාර්ගික වශයෙන් නොවන කාර්මික සාධක මත පදනම්ව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන උපලේඛනයේ I වන ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුව), II වන පරිශිෂ්ටයේ 3ː1 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති පරිදි රජයේ ඉඩම් පාවිච්චිය හා සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම;

(ආ) පස, දේශගුණය, වර්ෂාපතනය, පස සේදී යාම, වන ආවරණය, පාරිසරික සාධක, ආර්ථික යෝග්‍යතාව ආදී

කරුණු කෙරෙහි සැලකිලිමත්ව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන උපලේඛනයේ I වන ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුව), II වන පරිශිෂ්ටයේ 3:3 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති පරිදි, රජයේ ඉඩම් පාවිච්චිය හා සම්බන්ධ පොදු න්‍යාය නියම කිරීම;

(ඈ) (අ) වන ඡේදය යටතේ වන ජාතික ප්‍රතිපත්තිය සැකසීමේ දී රජයේ ඉඩම් සම්බන්ධයෙන් අවශ්‍ය වන සමීක්ෂණ, පරීක්ෂණ හෝ විමර්ශන සිදු කිරීම සහ ඒ සම්බන්ධයෙන් වාර්තා සකස් කිරීම;

(ඇ) යම් බැංකුවක ජංගම, ඉතිරි කිරීමේ හෝ වෙනත් තැන්පතු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම සහ අවශ්‍ය අවස්ථාවක දී, එම ගිණුම් වසා දැමීම; සහ

(ඉ) සාමාන්‍යයෙන්, කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය හා ආනුෂංගික හෝ සම්බන්ධිත සියලු වෙනත් ක්‍රියා හෝ දේ කිරීම.

(2) කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තියේ (අ) වන ඡේදය යටතේ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීමෙන් පසුව, අමාත්‍යවරයා විසින් එම ජාතික ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලයේ දැනගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පියවර ගත යුතු අතර, අමාත්‍යවරයා විසින් එම ජාතික ප්‍රතිපත්තිය ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය. තව ද, එම ජාතික ප්‍රතිපත්තිය අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ඇ) වන ඡේදය යටතේ වන කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ කිරීමේ දී, යම් රජයේ ඉඩමක අයිතිකරුට හෝ පදිංචිකරුට දින තුනක පූර්ව ලිඛිත දැනුම් දීමක් ලබා දීමෙන් අනතුරුව, දවසේ ඕනෑම සාධාරණ වේලාවක දී එම රජයේ ඉඩමට ඇතුළු වීම සඳහා කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවේ යම් සේවානියුක්තයකුට බලය ලබා දිය හැකි ය.

තොරතුරු

**15.** (1) මේ පනත යටතේ කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය කිසිවක් ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ කිරීමට හැකිවීමේ කාර්ය සඳහා, කොමිෂන් සභාව විසින් හෝ තත්කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් ලිඛිත දැන්වීමක් මගින් ඒ දැන්වීමේ නිශ්චිතව දක්වනු ලැබිය යුතු පරිදි රජයේ ඉඩම් සම්බන්ධ එකී තොරතුරු හෝ ලේඛනය, ඒ දැන්වීමේ නිශ්චිතව දක්වනු ලැබිය යුතු පරිදි එම කාලයක් ඇතුළත කොමිෂන් සභාව වෙත හෝ කොමිෂන් සභාව විසින් බලය දෙන ලද ඒ තැනැත්තා වෙත හෝ සපයන ලෙස, යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය.

(2) යම් තොරතුරක් හෝ ලේඛනයක් සපයන ලෙස (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් මගින් නියම කරනු ලැබූ යම් තැනැත්තකු විසින්, ඒ තොරතුර හෝ ලේඛනය සැපයීම යම් වෙනත් ලිඛිත නීතියක විධිවිධාන යටතේ වළක්වනු ලැබ ඇති අවස්ථාවක හැර, ඒ දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති එම කාලය ඇතුළත එම තොරතුර හෝ ලේඛනය සැපයීම එම තැනැත්තාගේ වගකීම වන්නේ ය.

## III වන කොටස

### තාක්ෂණික ලේකම් කාර්යාලය

තාක්ෂණික ලේකම් කාර්යාලය

**16.** කොමිෂන් සභාවට, ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාළ සමාජ-ආර්ථික සාධක මෙන්ම භෞතික සාධක ඇගයීම සඳහා අවශ්‍ය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන උපලේඛනයේ I වන ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුව), II වන පරිශිෂ්ටයේ 3:2 වන ඡේදයේ නිශ්චිතව සඳහන් පරිදි වූ අදාළ සියලු විෂයයන් නියෝජනය වන තාක්ෂණික ලේකම් කාර්යාලයක් තිබිය යුතු ය.

## IV වන කොටස

### කොමිෂන් සභාවේ අධ්‍යක්ෂවරයා සහ කාර්ය මණ්ඩලය

කොමිෂන් සභාවේ අධ්‍යක්ෂවරයා

**17.** (1) අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාව විමසා (මෙහි මින් මතු "අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවේ අධ්‍යක්ෂවරයකු පත් කරනු ලැබිය යුතු අතර, ඔහුගේ සුදුසුකම් සහ පළපුරුද්ද, පත්වීමේ නියම සහ කොන්දේසි නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(2) අධ්‍යක්ෂවරයා විසින්, කොමිෂන් සභාවේ සාමාන්‍ය විධානවලට සහ නිරීක්ෂණයට යටත්ව-

(අ) කාර්ය මණ්ඩලයේ පරිපාලනය සහ පාලනය ඇතුළුව කොමිෂන් සභාවේ කටයුතු පරිපාලනය කිරීම භාරව සිටිය යුතු ය;

(ආ) කොමිෂන් සභාවේ සියලු තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු ය; සහ

(ඇ) කොමිෂන් සභාව විසින් ඔහු වෙත පවරනු ලැබිය හැකි සියලු කර්තව්‍ය ඉටු කරනු ලැබිය යුතු ය.

(3) අධ්‍යක්ෂවරයාට කොමිෂන් සභාවේ යම් රැස්වීමකට පැමිණීමට සහ රැස්වීමක දී කථා කිරීමට හිමිකම් තිබිය යුතු නමුත් ඒ රැස්වීමක දී ඡන්දය භාවිත කිරීමට අධ්‍යක්ෂවරයාට හිමිකමක් නොතිබිය යුතු ය.

(4) අධ්‍යක්ෂවරයා විසින්, කොමිෂන් සභාවේ ලිඛිත අනුමතය ඇතිව, එසේ කිරීම අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන කවර හෝ විටෙක, මේ පනත යටතේ වූ ස්වකීය බලතල, කාර්ය හෝ කර්තව්‍ය කොමිෂන් සභාවේ යම් නිලධරයකුට හෝ සේවානියුක්තයකුට ලිඛිතව පවරනු ලැබිය හැකි ය. එම බලතල, කාර්ය හෝ කර්තව්‍ය පවරන ලද එම නිලධරයා හෝ සේවානියුක්තයා විසින් කොමිෂන් සභාවේ විධානවලට යටත්ව එම පවරන ලද බලතල, කාර්ය හෝ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම කරනු ලැබිය යුතු ය.

(5) අධ්‍යක්ෂවරයා විසින්-

(අ) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට හෝ කිරීමට ස්ථිරව ම අශක්නුතාවකට පත්ව ඇත්නම්;

(ආ) කොමිෂන් සභාවේ මතය අනුව, වංචනික හෝ නීති විරෝධී ස්වභාවයේ හෝ කොමිෂන් සභාවේ යහපතට අගතිගාමී වන යම් ක්‍රියාවක් සිදු කරනු ලැබ ඇත්නම්; හෝ

(ඇ) කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද යම් විධානවලට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වී ඇත්නම්,

අමාත්‍යවරයා විසින්, කොමිෂන් සභාව විමසා, අධ්‍යක්ෂවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(6) මියයාම, (5) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කිරීම හෝ එම ධුරය දරන තැනැත්තා විසින් තත්කාර්යය සඳහා අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඉල්ලා අස්වීම මත අධ්‍යක්ෂවරයාගේ ධුරය හිස් විය යුතු ය.

(7) අධ්‍යක්ෂවරයාගේ ධුරයේ යම් පුරප්පාඩුවක් ඇති වුවහොත්, (1) වන උපවගන්තිය යටතේ පත් කිරීමක් සිදු කරනු ලබන තෙක්, අමාත්‍යවරයා විසින්, කොමිෂන් සභාව විමසා අධ්‍යක්ෂවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම සඳහා කොමිෂන් සභාවේ පත් කළ සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

(8) අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ එකඟතාව ඇතිව, නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ පාරිශ්‍රමික අධ්‍යක්ෂවරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පත් කිරීම

**18.** (1) කොමිෂන් සභාව විසින්, මේ පනතේ විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි නිලධරයන් සහ සේවානියුක්තයන් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද නිලධරයන් සහ සේවානියුක්තයන් සම්බන්ධයෙන්, කොමිෂන් සභාව විසින්-

(අ) එම නිලධරයන් සහ සේවානියුක්තයන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම හෝ ඔවුන් සේවයෙන් පහකිරීම;

(ආ) එම නිලධරයන්ගේ සහ සේවානියුක්තයන්ගේ සේවානියුක්තියේ නියම සහ කොන්දේසි නිශ්චය කිරීම; සහ

(ඇ) රජයේ අදාළ මාර්ගෝපදේශවලට අනුව සහ මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා එම නිලධරයන්ට සහ සේවානියුක්තයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අනුප්‍රමාණ තීරණය කිරීම,

කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාව විසින්, කෙසේ වුව ද, රජයේ හෝ පුද්ගලික අංශයේ යම් කලින් දරන ලද තනතුරකින් පහකරන ලද තැනැත්තකු කොමිෂන් සභාවේ නිලධරයකු හෝ වෙනත් සේවානියුක්තයකු ලෙස පත් නොකළ යුතු ය.

**කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම**

**19.** (1) කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, එම නිලධරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාලසීමාවක් සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එම නිලධරයාට සහ එම නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එම නිලධරයාට සහ එම නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## V වන කොටස

## මුදල්

**කොමිෂන් සභාවේ අරමුදල**

**20.** (1) කොමිෂන් සභාවට එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) අරමුදලට පහත දැක්වෙන මුදල් බැර කරනු ලැබිය යුතු යඃ-

(අ) කොමිෂන් සභාවේ භාවිතය සඳහා පාර්ලිමේන්තුව විසින්, කලින් කල, වෙන් කර දෙනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණ; සහ

(ආ) කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම සඳහා කොමිෂන් සභාව වෙත ණය, පරිත්‍යාග, ත්‍යාග, රික්තවරණ හෝ ප්‍රදාන වශයෙන් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර කවර වූ හෝ මූලයකින් ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණඃ

එසේ වුව ද, කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවට සිදු කරනු ලබන සියලු විදේශ ප්‍රදාන, ත්‍යාග හෝ ආධාර සම්බන්ධයෙන්, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය.

(3) මේ පනත යටතේ කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ කිරීමේ දී කොමිෂන් සභාව විසින් දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය වන සියලු මුදල් ප්‍රමාණ, අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය කිරීම

**21.** (1) කොමිෂන් සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින්, එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ කොමිෂන් සභාවේ වෙනත් සියලු මූල්‍ය ගනුදෙනු සම්බන්ධයෙන් ද නිසි පරිදි ගිණුම් පොත් පවත්වාගෙන යාමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනයට අදාළ වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, කොමිෂන් සභාවේ ගිණුම් විගණනය කිරීමට අදාළ විය යුතු ය.

## VI වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

බලතල, කාර්ය සහ කර්තව්‍ය පැවරීම

**22.** (1) කොමිෂන් සභාව විසින්, ලිඛිතව නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි වූ නියම සහ කොන්දේසිවලට යටත්ව, මේ පනත යටතේ වන කොමිෂන් සභාවේ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක්, කොමිෂන් සභාවේ සභාපතිවරයාට හෝ සාමාජිකයකුට හෝ අධ්‍යක්ෂවරයාට පවරනු ලැබිය හැකි අතර සභාපතිවරයා හෝ එම සාමාජිකයා හෝ අධ්‍යක්ෂවරයා එම බලතල, කාර්ය හෝ කර්තව්‍ය කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන යම් සාමාන්‍ය හෝ විශේෂ විධානයන්ට යටත්ව ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද යම් පැවරීමක් නොසලකා, එසේ පවරන ලද යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම කරනු ලැබිය හැකි ය.

කමිටු හෝ අනුමණ්ඩල පිහිටුවීම

**23.** (1) මේ පනත යටත් කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ කිරීමේ දී ඊට සහාය දැක්වීම සඳහා කොමිෂන් සභාව විසින් කමිටු සහ අනුමණ්ඩල පිහිටුවනු ලැබිය හැකි අතර, කොමිෂන් සභාව විසින් එවැනි කමිටුවක හෝ අනුමණ්ඩලයක සාමාජිකයන් වීමට අවශ්‍ය යයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන යම් තැනැත්තන් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) කමිටුවක් හෝ අනුමණ්ඩලයක් විසින්, කොමිෂන් සභාව විසින් එම කමිටුවට හෝ අනුමණ්ඩලයට දෙන ලද යොමු කිරීම් අනුදේශයන්හි දක්වා ඇති ස්වකීය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ස්වකීය වගකීම් සපුරාලීම කළ යුතු ය.

(3) කොමිෂන් සභාව විසින්, අවශ්‍ය යයි සලකනු ලබන විට, අදාළ ක්ෂේත්‍රයේ නියමිත දැනුම සහ විශේෂඥතාව සතු යම් තැනැත්තකු, කමිටුවක හෝ අනුමණ්ඩලයක සාමාජිකයකු ලෙස, කොමිෂන් සභාව විසින් ඇතුළත් කර ගනු ලැබිය හැකි ය.

වාර්ෂික වාර්තා

**24.** (1) කොමිෂන් සභාව විසින්, එක් එක් මුදල් වර්ෂය අවසානයේ මාස හයක කාලයක් ඇතුළත, කොමිෂන් සභාව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ වාර්ෂික වාර්තාවක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. පහත දැක්වෙන ලේඛන ඒ වාර්තාවට අමුණනු ලැබිය යුතු යː-

(අ) විගණකාධිපතිවරයාගේ වාර්තාව සමඟ අදාළ වර්ෂය සඳහා කොමිෂන් සභාවේ විගණනය කරන ලද ගිණුම්; සහ

(ආ) එම වාර්තාව සහ ගිණුම් අදාළ වන වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන වර්ෂය සඳහා යෝජිත ක්‍රියාකාරකම්වල වාර්තාවක්.

(2) අමාත්‍යවරයා විසින්, වාර්ෂික වාර්තාව සලකා බැලීම සඳහා (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ලේඛන සමඟ එම වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබිය යුතු ය.

රහස්‍යභාවය පිළිබඳ ප්‍රකාශය

**25.** කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ අනෙකුත් සාමාජිකයන් සහ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂවරයා, නිලධරයන් සහ වෙනත් සේවානියුක්තයන් සහ 12 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් උපදෙස් ගනු ලබන සියලු ම විශේෂඥයන් සහ 23 වන වගන්තිය යටතේ පත් කරනු ලබන කමිටුවල හෝ අනුමණ්ඩලවල සාමාජිකයන් විසින්, ස්වකීය කාර්ය භාරගැනීමට පෙර, මේ පනත යටතේ තම බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ කිරීමේ දී තමාට දැනගැනීමට ලැබෙන කොමිෂන් සභාවේ කටයුතුවලට සම්බන්ධිත සියලු කාරණා සම්බන්ධයෙන් පූර්ණ රහස්‍යභාවය රැකීමට ප්‍රතිඥා දෙමින් ප්‍රකාශයකට අත්සන් තැබිය යුතු අතර, එම ප්‍රකාශය මගින්-

(අ) නෛතික අධිකරණයක් මගින් එසේ කිරීමට නියම කරනු ලැබූ විට; හෝ

(ආ) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ බලතල, කාර්ය සහ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීමේ, ඉටු කිරීමේ සහ කිරීමේ කාර්ය සඳහා,

හැර එවැනි යම් කිසිදු කාරණයක් හෙළිදරව් නොකිරීමට ඔහු විසින් ප්‍රතිඥා දිය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන්, අධ්‍යක්ෂවරයා, නිලධරයන් සහ සේවානියුක්තකයන් රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු බව

**26.** කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ අනෙකුත් සාමාජිකයන්, කොමිෂන් සභාවේ අධ්‍යක්ෂවරයා, නිලධරයන් සහ අනෙකුත් සේවානියුක්තයන් (19 වන අධිකාරය වූ) දණ්ඩනීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ කාර්ය සඳහා රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

දූෂණ විරෝධී පනතේ කාර්ය සඳහා කොමිෂන් සභාව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු බව

**27.** 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව කොමිෂන් සභාව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, එකී පනතේ විධිවිධාන ඒ අනුව කියවා තේරුම්ගත යුතු ය.

වැරදි

**28.** (අ) 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ස්වකීය කර්තව්‍ය හෝ කාර්ය ඉටුකිරීමේ දී හෝ කරගෙන යාමේ දී යම් තැනැත්තකුට විරෝධයපාන හෝ බාධා කරන;

(ආ) 15 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලෙස දක්වා ඇති යම් තොරතුරක් හෝ ලේඛනයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ප්‍රතික්ෂේප කරන; හෝ

(ඇ) 15 වන වගන්තිය යටතේ සපයන ලද යම් තොරතුරක් හෝ ලේඛනයක් අසත්‍ය හෝ වැරදි බව දැන දැනම ඉදිරිපත් කරන,

යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස්දහසක් නොඉක්මවන දඩයකට හෝ මාසයකට නොවැඩි කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය.

සිවිල් හෝ අපරාධ නඩුවක දී දරන ලද වියදම් අරමුදලින් ගෙවිය යුතු බව

**29.** (1) කොමිෂන් සභාව විසින් හෝ ඊට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී කොමිෂන් සභාව විසින් දරන ලද යම් වියදමක් කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී කොමිෂන් සභාව වෙත ගෙවන ලද හෝ කොමිෂන් සභාව විසින් අය කර ගන්නා ලද යම් ගාස්තු කොමිෂන් සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, කොමිෂන් සභාවේ අධ්‍යක්ෂවරයා හෝ යම් නිලධරයකු හෝ වෙනත් සේවානියුක්තයකු විසින්, මේ පනතේ විධිවිධාන යටතේ හෝ කොමිෂන් සභාවේ විධානය යටතේ කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් ඉදිරිපිට පවරන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී එම ක්‍රියාව සද්භාවයෙන් කරනු ලැබූ බවට අධිකරණය තීරණය කරනු ලැබුවහොත්, එම තැනැත්තා විසින් දරන ලද යම් වියදමක් එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඒ තැනැත්තා විසින් අය කර ගනු ලැබ ඇත්නම් මිස, කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**නියෝග**

**30.** (1) අමාත්‍යවරයා විසින්, මේ පනත මගින් නියම කරනු ලැබිය යුතු බවට නියමිත හෝ මේ පනත යටතේ නියෝග සාදනු ලැබීමට නියම කරනු ලැබ ඇති හෝ බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන ලද දිනයේ දී හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පසු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කළ දින සිට මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකරන ලද සෑම නියෝගයක් ම, ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙසට සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක්, එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙසට සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**රීති**

**31.** (1) කොමිෂන් සභාව විසින්, මේ පනතේ විධිවිධානවලට යටත්ව, මේ පනත යටතේ රීති සෑදීම සඳහා බලය ලබා දී ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් හෝ පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි යඃ-

(අ) කොමිෂන් සභාවේ රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම සඳහා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ එම රැස්වීම්වල කටයුතු සිදු කරගෙන යාම නියාමනය කිරීම; සහ

(ආ) කොමිෂන් සභාවේ කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධ යම් වෙනත් කාරණා.

(2) කොමිෂන් සභාව විසින් සාදන ලද සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එම රීති පළකරනු ලබන දින සිට හෝ රීතියේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි යම් පසු දිනයක දී හෝ බලාත්මක විය යුතු ය.

අර්ථ නිරූපණය

**32.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි-

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන සහ 45 වන ව්‍යවස්ථා යටතේ මෙම පනතේ විෂයය කාරණාව පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"පදිංචිකරු" යන්නට, යම් පරිශ්‍රයක පදිංචි තැනැත්තකු හෝ තමා වෙනුවෙන් හෝ වෙනත් යම් තැනැත්තකුගේ අනුයෝජිතයකු ලෙස යම් පරිශ්‍රයක භාරය, කළමනාකරණය හෝ පාලනය දරන තැනැත්තකු අදහස් වන අතර නවාතැන්කරුවකු ඇතුළත් නොවිය යුතු ය;

"පරිශ්‍රය" යන්නෙන්, යම් පරිශ්‍රයක් මත පවතින යම් ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිල්ලක කොටසක් සමඟ වන යම් භූමියක් අදහස් වේ; සහ

"ලිඛිත" යන්නට, විද්‍යුත් මාර්ගයෙන් නිර්මිත ලේඛන ද ඇතුළත් විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**33.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.